# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
Department of Samurdhi Development

සමාජ සවිබලගැන්වීම් හා සුබසාධන අමාත්‍යාංශය
சமூக வலுவூட்டல் மற்றும் நலனோம்புகை அமைச்சு
MINISTRY OF SOCIAL EMPOWERMENT AND WELFARE


| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல / My No: DDD/HO/MF/05/ | ඔබේ අංකය / உமது இல / Your No: ............ | දිනය / திகதி / Date: 2017/03/09 |

දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ,

දිස්ත්‍රික් සමෘද්ධි කාර්යාලය,

දිස්ත්‍රික් ලේකම් කාර්යාල සංකීර්ණය,

..................................................

**සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා සමෘද්ධි ප්‍රජාමූළ බැංකු සමිති වල නාම පුවරු නැවත සකස් කිරීම.**

2013 අංක 01 දරණ දිවිනැගුම පනත යටතේ පිහිටුවන ලද දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව හා ඊට අනුබද්ධ ක්‍රියාත්මක වන දිවිනැගුම ප්‍රජාමූල බැංකු හා දිවිනැගුභ ප්‍රජාමූල බැංකු සමිති වල නාම පුවරු මේ වන විට සකස් කර අදාල ස්ථාන වල ප්‍රදර්ශනය කර ඇත.

ඒ අතරතුරදී 2017 අංක 02 දරණ සමෘද්ධි සංවර්ධන පනත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර අනුමත වී ඊට අදාල ගැසට් පත්‍රය නිකුත් කිරීමෙන් පසුව දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව හා ඊට අනුබද්ධිත ප්‍රජාමූල බැංකු ජාලයෙහි නාමය පහත සඳහන් පරිදි සංශෝධනය වනු ඇත.

| දැනට භාවිතා කල නාමය | සංශෝධනය වූ නාමය |
|---|---|
| දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව | සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව |
| දිවිනැගුම ප්‍රජාමූල බැංකුව | සමෘද්ධි ප්‍රජාමූල බැංකුව |
| දිවිනැගුම ප්‍රජාමූල බැංකු සමිතිය | සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිතිය |

ඒ අනුව දිවිනැගුම ප්‍රජාමූල බැංකු හා දිවිනැගුම ප්‍රජාමූල බැංකු සමිති වල ප්‍රදර්ශනය කර ඇති නාම පුවරු ද නොපමාව නැවත සකස් කිරීමට කටයුතු කල යුතුව ඇත.

ඒ අනුව පහත දැක්වෙන උපදෙස් ප්‍රකාරව ප්‍රජාමූල බැංකු වල හා බැංකු සමිති වල නාම පුවරු සකස් කිරීමට අවශ්‍ය උපදෙස් ලබාදෙමි.

I. සකස් කරනු ලබන නාම පුවරුව අඩි 5 දිගින් හා අඩි 3 ක් පළල විය යුතුය.
II. ඒ සඳහා පසුබිමෙහි Golden Yellow වර්ණය හා කළු වර්ණයෙන් අකුරු ඇදිය යුතුය.


1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4th floor, Sethsiripaya ,Battaramulla

අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General — Tel- 011-2873802/2872202; Fax - 011-2889002; E-mail-dg@divineguma.gov.lk

අධ්‍යක්ෂ (මානව සම්පත්) / பணிப்பாளர் ( மனிதவளம்) / Director (Human Resource) — 011-2873799; 011-2873996; diradmin@divineguma.gov.lk; Hot Line : 0112-889007

ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant — 011-2869742; 011-2869742; finance@divineguma.gov.lk

අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance) — 011-2889003; 011-2887469; Hot Line:0112-885582

කාර්යාලය / அலுவலகம் / Office — 011-2887280; Hot Line: 011- 2887722; Desktop-Ruvini-Yasas Sir

III. සකස් කරන ලද නාම පුවරුව අගල් 1 ½ G.I. බට දෙකකින් ශක්තිමත් ලෙස පොළොවට සවිකල යුතුය.

IV. ප්‍රජාමූල බැංකුව හෝ බැංකු සමිතිය ප්‍රධාන මාර්ගයෙන් ඇතුලත පිහිටා ඇත්නම් ඉහත සඳහන් නාම පුවරුව බැංකු ගොඩනැගිල්ල අසල සවිකර ප්‍රධාන මාර්ගය මග පෙන්වීම සඳහා අඩි 31/2 දිගින් හා අඩි 2 ක් පළලින් යුතුය මග පෙන්වීමේ නාම පුවරු සකස් කර සවිකල යුතුය.

දැනට භාවිතා කරනු ලබන නාම පුවරු පිළිබඳව කටයුතු කල යුතු ආකාරය හා එහි අන්තර්ගතය සකස් කිරීම.

**(අ). දැනට භාවිතා කල නාම පුවරුව ඉතා හොඳ මට්ටමින් පවතින අවස්ථා වල කටයුතු කල යුතු ආකාරය**

- නාම පුවරුවෙහි දැනට භාවිතා කර ඇති වර්ණය ඉවත් කර ඉහත සඳහන් කර ඇති වර්ණය පසුබිමෙහි හා ඊට අදාල අකුරු කළු පාටින් නැවත සකස් කර අමුණා ඇති ආදර්ශනය පරිදි සකස් කල යුතුය.
- ඒ සඳහා රු. 7,500/- ක උපරිමයකට යටත්ව බැංකු වියදමින් වියදම් දැරිය යුතුය.

**(ආ). දැනට භාවිතා කරන නාම පුවරුව භාවිතයට ගත නොහැකි නම් ඒ සඳහා අළුතින් නාම පුවරුවක් සකස් කිරීමට කටයුතු කල යුතුය.**

- එහි දී ඉහත සඳහන් කර ඇති ප්‍රමාණයන්ගෙන් නාම පුවරු සකස් කල යුතුය.
- ඒ සඳහා නාම පුවරුවේ පසුබිමෙහි Golden Yellow වර්ණය යොදා අකුරු කළු පාටින් සකස් කල යුතුය.
- ඒ සඳහා රු. 20,000/- ක උපරිමයකට යටත්ව බැංකු වියදමින් ගෙවීම් කිරීමට කටයුතු කල යුතුය.

**(ඇ.) ප්‍රධාන මාර්ගයේ සිට මගපෙන්වන නාම පුවරුව සකස් කිරීම අළුතින් සිදු කල යුතුය.**

- ඒ සඳහා ද පසුබිමෙහි Golden Yellow වර්ණය හා අකුරු ඇඳීම සඳහා කළු වර්ණය භාවිතා කල යුතුය.
- ඒ සඳහා උපරිම වියදම ලෙස රු. 6,000/- ක් බැංකු අරමුදලින් දැරිය යුතුය.
- එම නාම පුවරුව ශක්තිමත් ලෙස G.I. අගල් 01 ½ ක බට දෙකකින් ශක්තිමත් ලෙස පොළොවට සවිකල යුතුය.

ඉහත සඳහන් ආකාරයට නාම පුවරු සකස් කර නොපමාව දිස්ත්‍රික් සමෘද්ධි කාර්යාලයට වාර්තා කිරීමට සමෘද්ධි ප්‍රජාමූල බැංකු / බැංකු සමිති කළමනාකරුවන් කටයුතු කල යුතුව ඇත.

ආදර්ශ නාම පුවරුව සකස් කර අමුණා ඇත.

**නීල් බණ්ඩාර හපුහින්න,**
**අධ්‍යක්ෂ ජනරාල්.**
**පිටපත :-**

01. ප්‍රාදේශීය ලේකම්,ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - අ.ක.ස.
02. කළමනාකරු, සමෘද්ධි ප්‍රජාමූල බැංකු / බැංකු සමිති - අ.ක.ස.